**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2022**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 752(2) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් 2020 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂවල වරින් වර පැවති උග්‍ර කොවිඩ් වසංගත තත්ත්වය මත භාණ්ඩ සමීක්ෂණ සිදුකිරීම ප්‍රමාද වූ බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ II කොටස | පනතේ II වන කොටසේ දක්වා ඇති අරමුණු ඉටුවන ආකාරයට 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. | ඉංජිනේරු තාක්ෂණ විෂය තුළ ඉදිකිරීම්, නිෂ්පාදනය සහ සේවා අංශවලට අදාළ පාඨමාලාවන් ක්‍රියාත්මක වෙමින් පවතී. අනෙකුත් සියළු පීඨවලද ඉහත කී ක්ෂේත්‍ර වලට අදාල සහ සේවා අංශයන්ට අදාලව පාඨමාලා පවත්වාගෙන යනු ලබන බව | පනතේ දක්වා ඇති අරමුණු ඉටුවන අයුරින් කටයුතු කල යුතුය. |
| (ඇ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/ 2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 04(i) වගන්තිය | පර්යේෂණ දීමනා සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් පර්යේෂණ යෝජනාව සම්පූර්ණ කර පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත භාරදී අනුමැතිය ලබාගත යුතු වුවද පර්යේෂණ යෝජනා ඉදිරිපත් නොකරන ලද නිලධාරීන් 43 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා ලෙස එකතුව රු. 13,437,487 ක් | 2020 දී සුදුසුකම් ලත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 5 දෙනෙකු, 2021 දී සුදුසුකම් ලත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 10 දෙනෙකු සහ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 5 දෙනෙකු සඳහා ව්‍යාපෘති යෝජනා සඳහා පර්යේෂණ දීමනාව ගෙවීම සිදු කරන ලද බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගෙවීම් සිදුකල යුතුය. |

සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.57,072,162 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.97,201,012 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,128,850 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු.50,380,825 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල විද්‍යායතනය තුලින් බිහිවන ඩිප්ලෝමාධාරීන්ට අමතරව මෙම විශ්වවිද්‍යාලය ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ක්‍රමය තුලින් උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂිත සිසුන් පදනම්ව ගොඩනැගුණු විශ්වවිද්‍යාලයක් බැවින් පාසල් පද්ධතිය තුල මෙම විශ්වවිද්‍යාලය ප්‍රචලිත කිරීමෙන් සිසුන් දැනුවත් කල හැකි වුවත් ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය සමාජ මාධ්‍ය වැඩසටහන්, මාධ්‍ය සාකච්ඡා මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වෘත්තීය මාර්ගෝපදේශකවරුන් මගින් පාසල් පද්ධතියද දැනුවත් කරන ලද බව. | පාසල් පද්ධතිය තුල සිසුන් දැනුවත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව බාහිර පාර්ශවයන් සමඟ සහයෝගීතාවයෙන් නව උපාධි පාඨමාලා හඳුන්වාදීම යටතේ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය පිළිබඳ උපාධිය, ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ උපාධිය හා අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය යනාදී පාඨමාලා හඳුන්වාදීම සිදුකර තිබුණද එම පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම උපාධි සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය හා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය යන 02ක සමග 2022.03.23 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම එම ආයතන 02 මගින් ඒකපාර්ශ්විකව උල්ලංඝනය කර තිබුණු බව. | හඳුන්වාදී ඇති පාඨමාලා කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් මාසයේදී ඊ පුස්තකාල සේවාව ස්ථාපිත කිරීම සඳහා රු.4,003,504 ක් වැයකර තිබුණද එය ක්‍රියාකාරීව පවත්වා ගෙන යාමට නොහැකිවීම තුලින් එම දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. තවද ඊ පුස්තකාලයෙන් ඉවත් කරන ලද පරිගණක 20 ක්, ස්ටූඩියෝ කබඩ් 05 ක් හා පුටු 20 ක් ද වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | ඊ - පුස්තකාල සේවාව ස්ථාපිතව පැවතියේ ප්‍රධාන පුස්තකාලය පිහිටා ඇති ගොඩනැගිල්ලෙන් පරිබාහිරව වෙනත් ගොඩනැගිල්ලක් තුල වේ. සීමිත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් පුස්තකාලයෙහි සේවයෙහි නියුතුව සිටින බැවින් ස්ථාන 02ක් වෙත කාර්ය මණ්ඩලය බෙදා හැරීම ඉතා අපහසුය. | සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් හා ඵලදායීතාවයකින් යුතුව භාවිතා කල යුතුය. |
| (ආ) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබාදී තිබූ අතර ඒ සඳහා රු. මිලියන 434.4 ක් මහා භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් වෙන්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු. මිලියන 304.5 ක් වියදම් කර තිබූ අතර මෙම ගොඩනැගිල්ලේ හඳුනාගත් දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයට භාරදී නොතිබුණි. | අප විසින් හඳුනාගත් දෝෂ ඉංජිනේරු උපදේශන කාර්යාංශය විසින් නිවැරදි කරන තෙක් අදාල ගොඩනැගිල්ලේ ප්‍රධාන චිත්‍රාගාරය (Main Studio) නිල වශයෙන් භාරගෙන නොමැත. නමුත් අප විසින් ප්‍රධාන චිත්‍රාගාරයද (Main Studio) අප විශ්වවිද්‍යාලයේ සහ විශ්වවිද්‍යාල විද්‍යායතන (University Colleges) වලත් සිසුන්ගේ ප්‍රායෝගික අධ්‍යයන කටයුතු සඳහා භාවිතයට ගනු ලැබේ.<br>නමුත් හඳුනාගත් දෝෂ ඔවුන් විසින් නිවැරදි කරන තෙක් ඔවුන්ට සිදුකළ යුතු ගෙවීම් කටයුතු අත්හිටුවා ඇත. අදාල ආයතනයේ බස්නාහිර පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් කඩිනමින් අදාල දෝෂ නිවැරදි කිරීමට එකඟ වූ බව. | රාජ්‍ය වියදම් උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් තිබෙන තත්ත්වයෙන් හෝ භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2014 ජුනි 23 දිනට රක්ෂිත වටිනාකම රු. 1,650,000 ක් වූ බස්රථයක් 2019 මාර්තු 21 දින සිට විගණිත දිනය වූ 2023 ජනවාරි 09 දින දක්වාම නිෂ්කාර්යව නවතා දමා තිබුණි. | බස්රථය අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 1.5ක් ලෙස ඇගයීම් කමිටුව විසින් සඳහන් කර තිබුණද ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොතිබුණි. ඒ සඳහා අදාල මුදල් 2021 වසරෙහි ප්‍රතිපාදන වලින් කළමණාකරණය කර ගන්නා ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය දී තිබුණු බව. | කඩිනමින් අලුත්වැඩියාවන් සිදුකිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විභාග අංශයේ කටයුතු සඳහා (EMIS) පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබූ අතර එම පද්ධතිය | විශ්වවිද්‍යාලයේ විභාග අංශයේ කටයුතු සඳහා භාවිතා කරනු ලබන පරිගණක පද්ධතිය (Education Management Information System – EMIS) හි එක් | පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුවන පරිදි අදාල පද්ධතිය ක්‍රියාත්මක කිරීමට හා |

| | | |
|---|---|---|
| භාවිතා කරන්නන් කළමනාකරණය කිරීම සඳහා නිසි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර පද්ධතිය විගණනය කිරීම සඳහා පහසුකම් (Audit Trails) පද්ධතිය තුල නොතිබුණි. ශිෂ්‍ය කටයුතු හා විභාග කටයුතු කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් පද්ධතිය තුල නොමැති බැවින් එම අඩුපාඩු නිවැරදි කිරීමට සහ නවීකරණය කිරීමට නිෂ්පාදිත ආයතනයට නොහැකි වී තිබුණි. තවද මානව සම්පත් කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතිය (SUWAS) වෙනුවෙන් රු.281,250 ක් වැය කර තිබුණද වාර්තාවේ දින දක්වාම ක්‍රියාත්මක තත්ත්වයට පත් කර නොතිබුණු අතර විශ්වවිද්‍යාලයේ පවතින පරිගණක විද්‍යාගාර 08ක් ඌන උපයෝජිතව ද පැවතුණි. | ඇඩ්මින් පරිශීලක ගිණුමක් පවතින අතර විභාග අංශයේ එම ගිණුම විභාග අංශ ප්‍රධානියා සතුව පවතී. විභාග අංශයේ අනෙකුත් නිලධාරීන් හට ඔවුන්ගේ රාජකාරීමය වපසරිය අනුව පද්ධතියේ ඔවුන්ට අදාල වන එක් එක් අංශ වෙත පමණක් ප්‍රවේශ පහසුකම ලබා දී ඇත. මීට අමතරව පද්ධතියේ පවත්නා තොරතුරු ඉවත් කිරීමේ හෝ වෙනස් කිරීමේ හැකියාව ඇඩ්මින් ගිණුම හිමි අංශ ප්‍රධානියා සතුව පමණක් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.<br>පවත්නා පද්ධතිය තුල කාර්යය ඉතිහාසයක් (Activity Log) පවත්වාගෙන යාමේ හැකියාවක් නොමැති අතර මේ නිසා දත්ත ඇතුලත් කිරීම, වෙනස් කිරීම හෝ ඉවත් කිරීම යන කාර්යයන් සිදුකළ අය, වෙලාව හා දිනය වැනි මූලික තොරතුරු පවා මේ හරහා ලබා ගැනීමට හැකියාවක් නොමැති බව. | වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ජනවාරි 03 දිනැති අංක අමප/16/2673/720/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, සිසුන් 600 ක් සඳහා නේවාසිකාගාරයක් සහ ආසන 300 කින් යුතු ආපන ශාලාවක් ඉදිකිරීමට රු.මිලියන 927.34 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. 2018, 2019 හා 2020 වර්ෂයන්හිදී මෙම ව්‍යාපෘති සඳහා රු. මිලියන 281.36 ක් වෙන්කර තිබුණ ද එම මුදලින් රු.මිලියන22.5 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණි. ඉහළ කළමනාකරණය විසින් නිසි කලට තීරණ නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 05 කට අධික කාලයක් ගත වී ඇතත් නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය 2022 ජුනි මාසයේදී රු.මිලියන 3,046.8 කට නැවත ඇස්තමේන්තුගත කර තිබූ අතර ව්‍යාපෘතිය ආරම්භක කාලය සමඟ සැසඳීමේදී සියයට 300 කටත් වඩා වැඩි පිරිවැයක් බවට පත් වී තිබුණි. | මීට වසර හයකට පමණ පෙර අප ආයතනයේ ඉදිරි අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලෙස වැඩහලක්, නේවාසිකාගාරයක් සහ ආපනශලාවක් ලෙස ගොඩනැගිලි තුනක් ඉදිකිරීමට අප විසින් තීරණය කරන ලදී. ඊට අදාල ව්‍යාපෘති යෝජනාව 2016 මැයි 31 වෙනි දින අමාත්‍යාංශය වෙත යොමුකර අදාල අනුමැතිය ලබාගත් අතර එම කටයුතු විවිධ වූ ගැටළු හේතුවෙන් වර්තමානය දක්වාම ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව | රාජ්‍ය මුදල් උපරිම කාර්යක්ෂමතා වයකින් හා ඵලදායීතාවය කින් යුතුව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති Director Staff Development Centre නැමති තනතුරක් සඳහා නිලධාරියෙකු 2020 දෙසැම්බර් 30 දින සිට 2022 මාර්තු 30 දින දක්වාත් තවත් නිලධාරියෙකු 2022 අප්‍රේල් 01 සිට නොවැම්බර් 30 දින දක්වාත් පත්කර එකතුව රු.3,758,629 ක දීමනා ගෙවා තිබුණි. | මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ක්‍රියාකාරකම් සහ භෞතික සංවර්ධනය පුළුල් වීමත් සමඟ ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර මෙම මධ්‍යස්ථානයේ රාජකාරි අධීක්ෂණය සඳහා අභ්‍යන්තර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙදෙනෙක් Director SDC ලෙස පත්කොට නිලබලයට හිමිවන දුරකථන දීමනාව, ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව පමණක් ගෙවා ඇති අතර අනෙකුත් දීමනා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරෙහි වැටුපට අයත් දීමනා වේ. ඒ අනුව උක්ත නිලධරයන් දෙදෙනාට ගෙවා ඇත්තේ රු 1,878,114.03 ක මුදලක් පමණි. | සේවක බඳවාගැනීම්වලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | පූර්ණ වැටුප් සහිත වසර 01 සිට වසර 2 ½ අතර කාලයක් අධ්‍යයන නිවාඩු ලබා සිටි නිලධාරීන් 04 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.11,086,021 ක්වූ අතර එම මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණු අතර ඉන් එක් නිලධාරියෙක් සේවයෙන් ඉල්ලා අස් වී තිබුණි. | අධ්‍යයන නිවාඩු ලබාගෙන සිය පශ්චාත් අධ්‍යයන කටයුතු මෙතෙක් අවසන් නොකල නිලධරයන් තිදෙනාට සිය අධ්‍යයන කටයුතු අවසන් කිරීමට දැනුම් දෙනු ලබන අතර අවසන් කිරීමට නොහැකි නිලධරයන් හට ගිවිසුම ප්‍රකාරව කටයුතු කරනු ලබන බව.<br>සේවයෙන් ඉවත්වූ නිලධරයා විසින් ගෙවිය යුතු බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා 2023-05-24 දින පැවැත්වෙන පාලක මණ්ඩල රැස්වීම වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිත බව. | අදාල ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. |